# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2338/39 - 2023 ජුනි මස 28 වැනි බදාදා - 2023.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනත

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII වන කොටස සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2023 ජුනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2023 අංක 01 දරන මෝටර් වාහන (තාවකාලික රියදුරු බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීමේ) නියෝග ලෙස හඳුන්වනු ලබන අතර 2023.07.01 දින සිට බලපැවැත්විය යුතු ය.

2. (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII වන කොටස යටතේ මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් 2022.03.31 දින සිට 2023.06.30 දක්වා නිකුත් කර ඇති සෑම තාවකාලික රියදුරු බලපත්‍රයකම වලංගු කාලය, එකී බලපත්‍රයේ කල් ඉකුත්වීමේ දිනය ලෙස කුමන දිනයක් සඳහන්ව ඇතත් නිකුත් කළ දින සිට වසර දෙකක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

EOG 06 - 0228

1A - PG 6372 — 381 (2023/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*